**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**

වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර ව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ගෙන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය විෂයයන් සඳහා පළාත් පාදකව උපාධිධාරීන් බඳවා ගැනීම සිදු කරන අතර එක් අයදුම්කරුවෙකු හට උපරිම වශයෙන් විෂයයන් 3 ක් සඳහා ඉල්ලම් කළ හැක.

02. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය වලට අදළ විෂයයන් සඳහා පවතින පුරප්පාඩු උපලේඛනයක් ලෙස මෙහි දක්වා ඇති අතර එම උපලේඛනයේ සඳහන් විෂයය පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ ඒ විෂයයට අදාළ ව දක්වා ඇති උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු අතර උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය.

04. *වැටුප් ක්‍රමය* : මෙම තනතුරට 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (iv) හි අංක ජී ඊ. 1 - 2016 ඒ වැටුප් බණ්ඩයේ රු. 31,490 - 6x445- 7x525 - 2x600- රු. 39,035 මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය හිමිවන අතර, මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 37,835 වැටුප් පියවරේ තබා ඔබට වැටුප් ගෙවනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 අධ්‍යාපන සුදසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ, ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, උපලේඛනයෙ හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබීම.

*සහ*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය විෂයයක් වශයෙන් සමත් ව තිබීම.

5.2 කායික සහ මානසික යෝග්‍යතාවය :

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.3 වයස :

අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.
iv. අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනවිට වයඹ පළාතේ අවම වශයෙන් වසර 03 ක කාලයක්වත් ස්ථිර ව පදිංචි ව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.

v. අයදුම්කරුහට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනවිට වයඹ පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැති වුවද, කලත්‍රයා හට මෙම පළාතේ අවම වසර 03ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම් එම අයදුම්කරුවන් පිළිබඳව ද සලකා බැලේ. (කලත්‍රයාගේ පදිංචි සහතිකය (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.)

06. *සේවා කොන්දේසි :-*

i. රාජ්‍ය /පළාත් සහා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

ii. මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම් ලාභීන් යටත් විය යුතුය.

iii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් විය යුතුය.

iv. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව තනතුරෙ හි උසස්වීම් සිදු කරනු ලැබේ.

v. 2020.10.16 දිනැති රා. ප. ච. 18/2020 අනුව සේවයට පත් වී වසර 03 ක් ඇතුළත් තනතුරට නියම කර ඇති දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

vi . පත්වීම්ලාභීන් මුල් පත්වීම ලබන පාසල අයත් අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් වසර 5 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම වසර 5 ක කාලය තුළ ස්ථානමාරු සඳහා ඉල්ලීම් කළ නොහැක.

viii. තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/දුෂ්කර පාසලක් නොවන කල් හි තම සේවා කාලය තුළ ඕනෑම අවස්ථාවක දී අවම වශයෙන් වසර 05 ක කාලයක් අතිදුෂ්කර/දුෂ්කර පාසලක සේවය කිරීමට ද මෙම පත්වීම් ලාභීන් බැඳී සිටී.

07. *බඳවා ගැනීම :*

7.1 බඳවා ගැනීමේ ක්‍රමය :

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

7.2 ලිඛිත තරග විභාගය : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය අංකය* | *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| 02 | සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විෂය නිර්දේශය :*

විෂයය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

- අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණුකොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය.

- (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

විෂයය අංක 02 - සාමාන්‍ය දැනීම

- සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳව වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.

- (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

7.3. විභාග පටිපාටිය :

i. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැක.
ii. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) ටම පෙනී සිටිය යුතුය.
iii. සෑම අපේක්ෂකයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය විය යුතුය.
iv. ඉංග්‍රීසි විෂයය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය යුතුය.
v. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.4 සම්මුඛ පරීක්ෂණය :

මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(අ) පන්ති සමාර්ථය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 07)

| | | |
|---|---|---|
| I | පන්තිය | ලකුණු 07 |
| II | පන්තිය ඉහළ පෙළ | ලකුණු 05 |
| II | පන්තිය පහළ පෙළ | ලකුණු 03 |

(ආ) අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම. (උපරිම ලකුණු 10)

| *අනු. අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂයය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික එකක් හෝ කීහිපයක් ලබා තිබීම. | 05 |
| | මුළු ලකුණු | 10 |

7.5 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 08)

ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් තමා අයදුම් කරන ලද විෂයයකට අදාළ මාතෘකාවක් යටතේ, විනාඩි 5 කට නොඅඩු ඉදිරිපත් කිරීමක් කළ යුතුයි. මෙහි දී අයදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාව සහ සන්නිවේදන කුසලතාව පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ.

08. *විභාග මධ්‍යස්ථාන :*

මෙම තරග විභාගය පහත දැක්වෙන නගරවල දී පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති නම් ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත.

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | 1 |
| කුරුණෑගල | කුලියාපිටිය | 2 |
| කුරුණෑගල | මහව | 3 |
| පුත්තලම | පුත්තලම | 4 |
| පුත්තලම | හලාවත | 5 |

09. *තෝරා ගැනීමේ ක්‍රමය :*

(අ) වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(ආ) යම්කිසි අපේක්ෂකයෙකු විෂයයන් දෙකකට (02) හෝ තුනට ම (03) තේරී ඇති අවස්ථාවක එම අයට පත්වීම් ලබා දෙන විෂයය පිළිබඳව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

10. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු වශයෙන් රු. 1,200 ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව. ප. ස. මු. 02 ලදුපත බාගත කරගත් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. ව. ප. ස. මු. 02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

11. *අයදුම් කළ යුතු පිළිවෙල :-*

11.1 (අ) මෙම බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ psc.nw.gov.lk දරන වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ. psc.nw.gov.lk දරන වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති උපදෙස් අනුගමනය කර අයදුම් කිරීම කළ යුතුය. ඊට අමතරව මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත PDF ගොනුවක් ලෙස බාගත කර එහි මුද්‍රිත පිටපතක් ද යොමු කළ යුතුය.

(ආ) අයදුම් කරනු ලබන විෂය/විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් මාර්ගගත අයදුම්පතක් පමණි.

(ඇ) බාගත කරන ලද මුද්‍රිත පිටපතෙහි, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය. (බාගත කරන ලද මුද්‍රිත පිටපතෙහි, ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක)

(ඈ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - **2023.11.17**

**11.2** මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත **2023.11.24** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතුය.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලි ව **"වයඹ පළාත් සහා ගුරු සේවයට පළාත් පාදකව උපාධිධාරීන් බඳවා ගැනීම 2023"** ලෙස හා **පදිංචි දිස්ත්‍රික්කය** සඳහන් කළ යුතුය.

නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා **2023.11.17 දිනට** හෝ එදිනට පෙර මාර්ගගතව අයදුම් කර, එහි මුද්‍රිත පිටපතක් යොමුකර ඇති අයදුම්කරුවන් සඳහා තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

11.3 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

බාගත කරන ලද අයදුම්පතෙ හි අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකරුවකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 41,580 කට වඩි ආරම්භක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත ලියවිලි වලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය /වලංගු රියදුරු බලපත්‍රය.

***සටහන*** : විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයම්කරුවෙකු විභාගයට, සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු ගුරුවරයෙකු ලෙස තෝරා පත් කර ගැනීමෙන් පසුව, සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට හැකිවේ.

14. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර හා ඉන්පසුව සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වන හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් පළ කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය හෝ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ප්‍රවේශ පත්‍රය/කැඳවීම් ලිපිය නොලැබුණි නම් ඒ බව වහාම ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය.

I. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
II. ලිපිනය :
III. ජාතික හැඳුනුම්පත් අංකය :
IV. අයදුම්කරුගේ දුරකථන අංකය :

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

16. මෙම විභාගය පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඊ. එම්. පී. ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

2023 ඔක්තෝබර් මස.

**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**

| *අනු. අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| | **ප්‍රාථමික අංශය (1-5 ශ්‍රේණි)** | |
| 1 | ප්‍රාථමික | (i) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම සිංහල භාෂාව/සිංහල වාග් විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>(ii) ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (උසස් පෙළ) සිංහල විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම ;<br>හෝ<br>(iii) ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස. (සා./පෙළ) විභාගයේ දී සිංහල විෂයය සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා තිබීම සහ අ.පො.ස. (සා./පෙළ) විභාගයේ දී ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| | **ද්විතීක අංශය (6-11 ශ්‍රේණි)** | |
| 2 | විද්‍යාව | (i) ජීව විද්‍යාව/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව විෂයය සහිත ව විද්‍යාවේදී /ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ උසස් පෙළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව සමත් වී තිබීම ;<br>හෝ<br>(ii) ඕනෑම විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 3 | ගණිතය | (i) ගණිතය විෂයය සහිත විද්‍යාවේදී /ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමඟ අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය/ගණිතය සමත් වී තිබීම ;<br>හෝ<br>(ii) ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය/ ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 4 | පළමු බස (සිංහල) සහ සාහිත්‍යය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම සිංහල/සිංහල වාග්විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. |
| 5 | පළමු බස (දෙමළ) සහ සාහිත්‍යය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම දෙමළ/දෙමළ වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. |
| 6 | ඉංග්‍රීසි | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය/ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. |
| 7 | ඉතිහාසය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ඉතිහාසය/පුරාවිද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය |
| 8 | භූගෝල විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 9 | පෙරදිග සංගීතය | (i) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>(ii) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම පෙරදිග සංගීතය විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 10 | චිත්‍ර | (i) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම චිත්‍ර ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ප්‍රාසාංගික කලාවේදී/දෘශ්‍ය කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>(ii) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම චිත්‍ර විෂයය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) චිත්‍ර විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 11 | පෙරදිග නර්තනය | (i) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග නර්තනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>(ii) සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම පෙරදිග නර්තනය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උසස් පෙළ) පෙරදිග නර්තනය විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 12 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණවේදී/ශාස්ත්‍රවේදී/තොරතුරු තාක්ෂණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය |
| 13 | කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය හෝ කෘෂි හා ආහාර තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 14 | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | (i) ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය/ශාරීරික අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය ;<br>හෝ<br>(ii) ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂ උපාධිය. |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| | **තෘතීක අංශය (12-13 ශ්‍රේණි)** | |
| 15 | ගිණුම්කරණය | ගණකාධිකරණය/ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධිය හෝ සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ගණකාධිකරණය/ගිණුම්කරණය විෂයය හදාරා ඇති ව්‍යාපාර පරිපාලනවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී/විද්‍යාවේදී/වාණිජවේදී විශේෂ උපාධිය |
| 16 | ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර අධ්‍යයනය/වාණිජ්‍ය යන විෂයය ක්ෂේත්‍රයන්ට අයත් විෂයයන් ප්‍රධාන විෂයයන් ලෙස හදාරා ඇති වාණිජවේදී/ව්‍යාපාර පරිපාලනවේදී/විද්‍යාවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ උපාධිය. |
| 17 | ආර්ථික විද්‍යාව | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය |

**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**

| | විෂය | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික | 326 | 39 | 0 |
| 2 | විද්‍යාව | 53 | 2 | 3 |
| 3 | ගණිතය | 57 | 19 | 2 |
| 4 | සිංහල භාෂාව හා සාහිත්‍යය | 21 | 0 | 0 |
| 5 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | 0 | 2 | 0 |
| 6 | ඉංග්‍රීසි | 0 | 0 | 43 |
| 7 | ඉතිහාසය | 21 | 4 | 0 |
| 8 | භූගෝල විද්‍යාව | 13 | 1 | 4 |
| 9 | පෙරදිග සංගීතය | 12 | 0 | 0 |
| 10 | චිත්‍ර | 24 | 4 | 0 |
| 11 | පෙරදිග නර්තනය | 12 | 0 | 0 |
| 12 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 23 | 10 | 3 |
| 13 | කෘෂි කර්මය හා ආහාර තාක්ෂණය | 14 | 3 | 0 |
| 14 | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | 10 | 5 | 0 |
| 15 | ගිණුම්කරණය | 5 | 1 | 0 |
| 16 | ව්‍යාපාර අධ්‍යයනය | 3 | 0 | 1 |
| 17 | ආර්ථික විද්‍යාව | 4 | 1 | 0 |
| | **එකතුව** | **598** | **91** | **56** |